කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.4 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව ක්ෂය අඩු කළ පසු අගය ශුන්‍ය වී ඇති නමුත් ප්‍රයෝජනයට ගන්නා රු. 73,532,817 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 05 ක් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමේ වටිනාකම ගිණුම්ගත කිරීමට පෙර එහි උපදේශන ගාස්තු වෙනුවෙන් ගෙවූ රු. 267,937 ක අත්තිකාරම් මුදල මූල්‍ය ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නාමපුවරු වෙනුවෙන් ගෙවූ රු. 175,000 ක් මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත නොකර වෙනත් වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලැබිය යුතු පාඨමාලා ගාස්තුව රු.31,364,000 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එහි අගය රු. 30,758,250 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයට අදාල පාඨමාලා ගාස්තුව රු. 605,750 ක් අඩුවෙන්

දක්වා තිබුණි.

(ඇ) 2008 මාර්තු 03 දිනට පිරිවැය රු. 2,589,277 ක්වූ මෝටර් රථ රු. 2,250,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් අතර වෙනස වූ රු. 339,277 ක් 2011 වර්ෂයේදී මෝටර් රථ ගිණුමට ගැලපීම් කර තිබුණත්, එදිනට මෝටර් රථවල සමුච්චිත ක්ෂය වටිනාකම වූ රු. 2,429,548 ක් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ලැබිය යුතු පාඨමාලා ගාස්තු සහ ලියාපදිංචි කිරිමේ ගාස්තු රු. 57,343,541 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

1.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

---------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම්වල අගය රු.12,013,000 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛනයේ වර්ෂයේ මිලදී ගත් ස්ථාවර වත්කම්වල වටිනාකම රු.12,575,683 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.562,683 ක වෙනසක් විය.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 65,308,307 | ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛණ සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු සහ සවිකිරීම් | 1,580,328 | - එම - |
| කාර්යාල උපකරණ | 7,262,331 | - එම - |
| මොටර් රථ | 14,495,000 | - එම - |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 33,702,296 | - එම - |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 44,488,869 | - එම - |

166,837,131

=========

### 1.2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය සමඟ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව මුදල් ආයෝජනය කළ යුතු වුවත්, ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන කර තිබුණු රු.62,200,000 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 188 | 2012 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් තැන්පත් කල නමුත් නිශ්කාෂණය නොවූ රු. 17,070 ක් වටිනා චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv වැනි පරිච්ඡේදයේ 28.5 සහ 28.6 ඡේද | දින 30 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන ගමන් වියදම් ඉල්ලුම්පත්‍ර 14 කින් රු. 16,856 ක ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. |
| (ඈ) චක්‍රලේඛ | |
| (i) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.2 ඡේදය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ / විශ්වවිද්‍යාල ආයතන | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂා කළ යුතු වුවද, ආයතනය සතු පැරණි වාහන 04 ක වසර 03 |

| | | |
|---|---|---|
| | සංග්‍රහයේ xxvii පරිච්ඡේදයේ 08 වන වගන්තිය | සිට වසර 16 දක්වා එම පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (iii) | 1994 ජුනි 14 දිනැති අංක 95(02) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2003 ජනවාරි 29 දිනැති අංක PE 1/174/1-2003 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය යටතේ ඇති ආයතනවල කටයුතු කිරීම වෙනුවෙන් දීමනා ගෙවීමේදී අමාත්‍ය මණ්ඩලයේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගතයුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව, 2012 වර්ෂයේ කෙටිකාලීන පාඨමාලා සම්බන්ධීකරණ දීමනා, දේශන හා ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු වෙනුවෙන් අවස්ථා 13 කදී රු.417,000 ක මුදලක් ගෙවා තිබුණි. |

1.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 මාර්තු 10 දිනැති අංක පීඊ.1/174/11(ආ) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධානවලට පටහැනිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ උපදෙස් මත දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා ලෙස 1996 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 1,275,179 ක් ගෙවා තිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක PED 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, කළමණාකරණ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් විධායක අධ්‍යක්ෂ නොවන කමිටු සාමාජිකයන් සඳහා පමණක් රු. 1,000 ක් බැගින් ගෙවීම් කළහැකි වුවද, එකී විධිවිධානවලට පටහැනිව අධ්‍යයන මණ්ඩල ලේකම්වරුන් 09 දෙනෙකු වෙත 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මසකට රු. 1,000 බැගින් අධ්‍යයන මණ්ඩල 09 ක් වෙනුවෙන් රු. 324,000 ක් ගෙවීම් කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ වැඩකටයුතු වලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 5,871,268 ක අතිරික්තයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා වූ රු. 15,400,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එය රු. 21,271,268 ක අතිරික්තයක් ලෙස වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර වූ ඌනතාවය රු. 5,369,318 ක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රු. 22,585,072 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එය රු. 17,215,754 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,055,514 ක අතිරික්තයේ වැඩිවීමක් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

1975 වර්ෂයේ ආරම්භ කර තිබූ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටි ඉඩමේ අයිතිය පේරාදෙණිය විශ්ව විද්‍යාලය සතු වන අතර, එම ඉඩමේ 2012 දෙසැම්බර් 31 වන විට රු.65,308,307 ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණත්, ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

වාහන මිලදී ගැනීම සඳහා 2012 මාර්තු 13 වන දින පත්කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය අනුව රු. 7,950,000 ක්වූ වෑන් රථයක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමට තීරණය කර තිබූ අතර, අදාල සැපයුම්කරුගේ මිල කියුමේ වලංගු කාලය ඉක්මවීමට පෙර යළි ලබාගන්නා ලද තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය පරිදි එම වාහනය රු. 8,350,000 ක

මුදලකට මිලදී ගැනීම හේතුවෙන්, එකග වූ මිලට වඩා රු. 400,000 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ආයතනයේ අධ්‍යක්ෂකවරයා විසින් භාවිතා කරනු ලබන වාහනයට අදාල මාසික ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා වවුචර් 02 ක් අනුමත කරගෙන රු. 29,643 ක් ලබාගෙන තිබුණි.

3.4 අරමුදල් ඌන උපයෝජනය

බාහිර පර්යේෂණ 03 ක් වෙනුවෙන් 2010 ජනවාරි 01 දින වන විට ආයතනයට ලැබී තිබුණු රු. 653,318 ක මුදලක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

3.5 ප්‍රමාදවූ ව්‍යාපෘති

ආයතනයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානයට ඇතුළුවන සිසුන් හඳුනාගැනීම සහ කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා සංඛ්‍යාත හැඳුනුම්පත් පද්ධතියක් ස්ථාපනය කිරීම වෙනුවෙන් 2010 ජුනි 07 දින රු. 216,092 ක අත්තිකාරම් මුදලක්ද, 2012 දෙසැම්බර් 31 දින ඊට අදාල කොටස් ගෙවීමක් ලෙස රු. 326,819 ක්ද, වශයෙන් එකතුව රු.542,911 ක් ගෙවා තිබුණු නමුත්, 2013 අප්‍රේල් මාසය වන විටත්, එම පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 08 ක් වූ අතර, එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර, බාහිර දේශකවරුන් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය

තුළදී රු.15,246,638 ක් දේශන ගාස්තු වශයෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාර මානව සම්පත් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය තුළ රු. 12,589,380 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.2 අධ්‍යයන කමිටු

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 14(7) උපඡේදය ප්‍රකාර, එක් වසරක් තුළ අවම වශයෙන් අධ්‍යයන කමිටු රැස්වීම් වාර 06 ක් පැවැත්විය යුතු වුවද, ආයතනයේ ක්‍රියාත්මක වන අධ්‍යයන කමිටු 07 ක් රැස්වීම් වාර 03 ත් 05 ත් අතර ප්‍රමාණයක් පවත්වා තිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.4 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව, විගණන කමිටුව මගින් තම තීරණ අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, පහත සඳහන් කරුණු විගණන කමිටුවේ විෂය පථයට අදාල කර ගෙන නොතිබුණි.

(අ) අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම

(ආ) ආයතන තුළ ක්‍රියාත්මක වනු ලබන සියලු ක්‍රියාකාරකම්වලට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා ඇගයීම් කිරීම

(ඇ) වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා නිරීක්ෂණයන් ඇතුළත් වාර්තා

(ඈ) රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මහපෙන්වීම් පිළිබඳ සමාලෝචනය

(ඉ) අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් සමාලෝචනයක් හා ඉදිරි ක්‍රියා මාර්ග

4.5 අයවැය ලේඛනමය පාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ඡේදය ප්‍රකාරව, අයවැය කෙටුම්පත් මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට ප්‍රථම කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා 2012 මාර්තු 30 දින අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ වියදම් ඇස්තමේන්තුවේ සඳහන් වැය විෂයයන් 12 කට ඇස්තමේන්තුකළ වියදම් ඉක්මවා එකතුව රු. 2,294,209 ක් වැය කර තිබුණි. එමෙන්ම වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ වැය විෂයයන් 02 ක් වෙනුවෙන් රු. 395,858 ක් වැය කර තිබුණි. වැය විෂයයන් 02 ක් සඳහා ඇස්තමේන්තුකළ රු. 950,000 ක් වැය නොකර ඉතිරි කර තිබුණි. අයවැයගත ආදායම හා තථ්‍ය ආදායම සැසඳීමේදී වැය විෂයයන් 12 කට ඇස්තමේන්තුකළ ආදායම රු. 9,252,404 කින් ළඟාවී නොතිබුණි. ආදායම් විෂයයන් 09 ක් වෙනුවෙන් ඇස්තමේන්තුකළ ආදායම ඉක්මවා රු. 13,390,089 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආයතනය විසින් පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා අධ්‍යක්ෂකවරයා වෙත වරින් වර මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ගෙවීම් හා අත්තිකාරම් පිළිබඳ පාලනය

(ඈ) පුස්තකාල පොත් පරිහරණය